පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සතිය - දෙසැම්බර් පළමු සතිය පුනරීක්ෂණ

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය

සැකසීම - ජී.ඒ.සී.ඩී.කුමාරි - ර/නිවි/ සිරි සිද්ධාර්ථ මහා

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම ඔබගේ වගකීමකි.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- විද්‍යුත් පැතුරුම්පත් පාඩම අධ්‍යනය කරමින් පහත ක්‍රියාකාරකම්හි නිරත වන්න.
- *ඔබේ පිළිතුරු හෝ නිර්මාණ **පුනරීක්ෂණ - ICT- ඔබේ නම හා ශ්‍රේණිය** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

01. පහත වගන්ති සත්‍ය ද අසත්‍යය ද යන්න ලියා දක්වන්න.

i. පැතුරුම්පතක තීරු ඉංග්‍රීසි අක්ෂරයකින් නම් කරයි.


ii. එක් වැඩපොතකට නව වැඩපත් එකක් පමණක් ලබා ගත හැකිය.

iii. නිවැරදි කෝෂ ලිපිනයකට උදාහරණයක් ලෙස 75E ගත හැකිය.

iv. සූත්‍රයක් ආරම්භ කිරීමට පෙර = ලකුණ යෙදීම අනිවාර්යය වේ.

v. කෝෂ අතර ගණනය කිරීම් සඳහා + , - , * , / ආදි ලකුණු භාවිත කළ හැකිය.

02. පහත වැඩපත භාවිතයෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (සියලු පිළිතුරු වැඩපතෙහි සලකුණු කරන්න)



i. A10 කෝෂය (1) ලෙස නම් කරන්න.


ii. නාම කොටුව සොයා එය (2) ලෙස නම් කරන්න.

iii. C1:C5 කෝෂ පරාසය ඇඳ එය (3) ලෙස නම් කරන්න.

iv. සූත්‍ර තීරුව (4) ලෙස නම් කරන්න.

v. අකුරු වර්ගය වෙනස් කිරීමට භාවිත කරන මෙවලම තෝරා එය (5) ලෙස නම් කරන්න.

03. පහත පැතුරුම්පත භාවිත කරමින් ලබා දී ඇති සූත්‍ර විසඳන්න.




i. = A1+A2

ii. = A1+B1+C1

iii. = C2-C1

iv. = B2*C2

v. = A1+B2-C2

04. ඔබ දන්නා විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණ 2 ක් ලියන්න.

05. විද්‍යුත් පැතුරුම්පත් භාවිතයෙන් සිදු කළ හැකි කාර්යයන් ලැයිස්තුගත කරන්න.